<u>ග්‍රන්ථනාම පිටුව:</u>

# බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හෙළිවන තනතුරු නාම සහ විරුද නාම පිළිබඳ විමර්ශනයක්

<u>( ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ හතරවන සියවස දක්වා )</u>

අප්පුකුට්ටි ආරච්චිගේ ලංකා රජී නිශ්ශංක
**FGS/HIST/MC/09/001**

ප්‍රවේශ අංකය: 809
වර්ග අංකය:

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ඉතිහාසය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2011 සැප්තැම්බර්.

## නිබන්ධ සාරාංශය :

ශ්‍රී ලංකාව වසර දෙදහස් පන්සියයකට වඩා දීර්ඝවූත් අඛණ්ඩවූත් ලිඛිත ඉතිහාසයකට උරුමකම් කියනු ලබන රාජ්‍යයකි. සාහිත්‍යය මූලාශ්‍රයමය වශයෙන් ලිඛිතව පවතින එම ඓතිහාසික සිද්ධීන් ශිලාලේඛනමය පුරාවිද්‍යා මූලාශ්‍රය අනුව ද සනාථ වේ.ශ්‍රී ලංකාවෙන් දැනට සොයාගෙන ඇති ශිලාලේඛනමය මූලාශ්‍රය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ රජ කළ දේවානම්පියතිස්ස යුගයේ සිට ආරම්භ වූ බවට සාධක ලැබේ. එම ලේඛන රචනා වී ඇත්තේ ඉන්දියාවේ මෙකල විසූ මෞර්ය වංශික අශෝක අධිරාජ්‍යයාගෙන් ලැබුන අභාසය නිසා බ්‍රාහ්මී අක්ෂරයෙනි. ඒ සඳහා ප්‍රධානත ම හේතු සාධකය වුයේ එම රජුගේ අනුග්‍රයෙන් ඉන්දියාවේ පවත්වනු ලැබූ තෙවැනි බෞද්ධ ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ හි බුදු දහම ස්ථාපිත කිරීම සඳහා වැඩම කළ මහින්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූතයන් වහන්සේලා බ්‍රාහ්මී අක්ෂර හඳුන්වා දීම යැයි සාමාන්‍ය පිළිගැනීම වී ඇත. නමුත් එම සිදුවීමට සියවස් තුනකට පෙර සිට එනම් ක්‍රි. පූ. 6 වන සියවසේ සිට ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිත වූ බවට අභිලේඛනමය සාධක අනුරාධපුර ඇතුලු නුවර "සල්ගහවත්ත" කැණීම් මගින් ලැබී ඇත. ක්‍රි.පූ. 6 වන සියවසට පමණ අයත් වළං කැබලි කීපයක ඇති එම බ්‍රාහ්මී අක්ෂර මගින් පමණක් බ්‍රාහ්මී ලේඛන මහින්දාගමනයට පෙර සිට පුළුල් ලෙස පැතිරී පැවති බව නිගමනය කළ නොහැකි ය.

මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය වූයේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ හතරවන සියවස අතර රචනා වූ පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන "අභිධාන" හෙවත් "විරුදනාම" හෙවත් "උපාධිනාම" පිළිබඳ ව හා තනතුරු නාම පිළිබඳව වූ විමර්ශනයක යෙදීමයි. පූර්ව හා අපර බ්‍රාහ්මී අක්ෂරවලින් කරන ලද ලිපි සහිත යුගයෙන් පසුවත් භාවිත වූ විරුදනාම බොහෝ සංඛ්‍යාවක් ශිලාලේඛනවල සඳහන්ව ඇත. නමුත් පර්යේෂකයාගේ අධ්‍යයනයට හසු වන්නේ බ්‍රාහ්මී අක්ෂරවලින් කරන ලද ලිපි සහිත යුගය පමණක් වන හෙයින් ඒ පිළිබඳව මෙහිදී අධ්‍යයනය නොකෙරේ.

මෙම අධ්‍යයනයේ පළමුවන පරිච්ඡේදය මගින් ඉන්දියාවේ සහ ලංකාවේ අභිලේඛන සොයා ගැනීම හා අර්ථගැන්වීම පිළිබඳව ත් ශිලාලේඛන වර්ග පිළිබඳව ත් අක්ෂර යුග බෙදීම පිළිබඳව ත් ශිලාලේඛන හැදෑරීම සඳහා සාහිත්‍යය මූලාශ්‍රයවලින් ලබාගත හැකි පිටිවහල පිළිබඳව ත් සාකච්ඡා කරන ලදී.

දෙවන පරිච්ඡේදයේ සිට පස්වන පරිච්ඡේදය දක්වා බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන "විරුදනාම" සහ "තනතුරුනාම" පිළිබඳව විමර්ශනයක යෙදී ඇත. එහිදී අධ්‍යයනයේ පහසුව තකා දෙවන පරිච්ඡේදය මගින් "මහරජවරුන් හා ප්‍රාදේශිය පාලකයන් භාවිත කළ විරුදනාම සහ තනතුරු නාම පිළිබඳව ත් තුන්වන පරිච්ජේදය මගින් "ප්‍රධාන නිලධාරීන් භාවිත කළ විරුදනාම සහ තනතුරු නාම " පිළිබඳව ත් සිව්වන පරිච්ඡේදය මගින් "අප්‍රධාන නිලධාරීන් භාවිත කළ විරුදනාම සහ තනතුරු නාම " පිළිබඳව ත් විමර්ශනයක යෙදී ඇත. පස් වන පරිච්ඡේදය මගින් "භික්ෂූන් වහන්සේලා භාවිත කළ විරුදනාම" පිළිබඳව විමර්ශනයක යෙදී ඇත . හයවන පරිච්ඡේදය වෙන්ව ඇත්තේ "සමාලෝචනය සහ නිගමන" සඳහා ය. එහිදී බ්‍රාහ්මී ශිලාලේඛනවල විරුදනාම සහ තනතුරු නාම යෙදීම පිළිබඳව පොදු සමාලෝචනයක් කර ඇති අතර ඒ ඔස්සේ එලඹිය හැකි නිගමන දක්වා ඇත.